# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ නියාමන, සංවර්ධන සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පවතින විගණන නිලධාරී තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් කාර්යශීලී, උද්යෝගිමත් හා විචක්ෂණශීලී ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## විගණන නිලධාරී තනතුර - JM 1-1 (II ශ්‍රේණිය)

**රැකියා පිරිවිතරය :**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බලයලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත අභ්‍යන්තර විගණන සැලසුම අනුව විගණන කටයුතු සිදුකිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

(I) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණය/ මූල්‍ය/ වාණිජ්‍යය පිළිබඳ විශේෂ උපාධිය

හෝ

(II) ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලයෙන් ලබාගත් ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA)

හෝ

(III) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයෙහි (ICASL) අන්තර් මධ්‍යම විභාගය සමත්වීම හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ආයතනයෙහි (CIMA) අන්තර් මධ්‍යම විභාගය සමත්වීම හෝ සහතික ලත් වරලත් ගණකාධිකාරීන්ගේ සංගමය (ACCA) අන්තර් මධ්‍යම විභාගය සමත්වීම

සහ

උපාධිය, ඩිප්ලෝමාව හෝ වෘත්තීය සුදුසුකම ලබාගැනීමෙන් අනතුරුව රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයෙහි වසරක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

I. උක්ත බාහිර කාණ්ඩය යටතේ සඳහන් සුදුසුකම් සපුරා තිබීම

හෝ

II. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ II ශ්‍රේණියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම.

**වැටුප් පරිමාණය :**

JM 1-1 2016A රු. (42,600-10Xරු. 755-18X1,135- රු. 70,580 (මාසිකව))

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2006 අනුව ආරම්භක මාසික වැටුප් පියවර රු. 38,185/- හා රජයේ අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ. ඒ අනුව ආසන්න වශයෙන් රු. 45,000/- පමණ ආරම්භක මාසික වැටුපක් හිමිවේ.

**වයස් සීමාව :**

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

**පොදු කොන්දේසි :**

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා සෞඛ්‍ය තත්ත්වයකින් පරිපූර්ණ විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් මනා චරිතයකින් හෙබි පුද්ගලයින් විය යුතුය.
- තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයකට යටත්ව බඳවා ගනු ලබන අතර, තනතුරෙහි ස්ථිර කරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් වසරක පරීක්ෂණ කාලයකට යටත්ව පත්කිරීම සිදුකරනු ලැබේ.
- සියලු තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ පිහිටුවන අතර, අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ වැටුප ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයෙහි 04 ඡේදය ප්‍රකාරව පිහිටුවනු ලැබේ.

**වෙනත් ප්‍රතිලාභ :**

- මණ්ඩලයේ දැනට පවතින නීතිරීතිවලට අනුකූලව වෛද්‍ය සහනාධාර පහසුකම් ලබාදෙනු ඇත.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔහුගේ/ ඇයගේ වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සඳහා ගෙවිය යුතු අතර, මණ්ඩලය ඒ සඳහා 15% කින් දායක වනු ඇත.
- මණ්ඩලය තවදුරටත් සේවා නියුක්ත භාර අරමුදලට ඔහුගේ/ ඇයගේ වැටුපෙන් 3% කින් දායක වනු ඇත.

**අයදුම් කිරීම :**

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයද සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

මෙම කාර්යාලයෙන් හෝ www.srilankateaboard.lk වෙබ් අඩවියෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රය පරිදි සකස් කරන ලද අයදුම්පත් උප්පැන්න සහතිකයේ සහ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමඟ 2019 අගෝස්තු 30 වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලි.ප.තැ. එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්,
**ශ්‍රී ලංකා තේ මණ්ඩලය,**
**574, ගාලු පාර, කොළඹ 03.**

© THE ASSOCIATED NEWSPAPERS OF CEYLON LTD. ALL RIGHTS RESERVED.

Source: Silumina, Sunday Observer (2019.08.11), Application Form : www.srilankateaboard.lk